**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (කොටස - I) 2016**

---

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (කොටස - I) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

එවකට මහා මාර්ග වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. 2015 ජුලි 08 දින පැවති එහි රැස්වීමේදී කැබිනට් අමාත්‍යවරුන්ගේ තීරණයට අනුව, මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කොටස් 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ අතර මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු කොටස කඩවත සිට මීරිගම දක්වා කිලෝමීටර් 36.59 කින් සමන්විත කොන්ත්‍රාත් පැකේජ 02 යටතේ ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. කෙසේවෙතත්, 2016 දෙසැම්බර් 31 දිනට චීන එක්සිම් බැංකුවේ සහයෝගය සහිතව මූල්‍ය වැඩපිළිවෙල සමාප්ත කර නොතිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2016 දෙසැම්බර් 29 ආරම්භ කරන ලද අතර 2020 අගෝස්තු 31 වන විට නිමකිරීමට සැලසුම් කිරීමට  නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ  මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේ ද යන බව,

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

මාර්ග සංවර්ධන අධිකාරිය සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතියට දේපල පිරියත හා උපකරණ අයිතම 199 ක් මාරු කර තිබුණි. කෙසේවෙතත්, අදාල වත්කම්වල වටිනාකම් තීරණය කර නොතිබුණ අතර ගිණුම්වලට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

-------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

---------------------

මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව තුල රු.මිලියන 2,944 ක මුදලක ප්‍රතිපාදනයක් සිදුකර තිබුණ අතර ඉන් රු.මිලියන 1,070 ක මුදලක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 1 කොටස සඳහා වෙන්කර තිබුණි. කෙසේවෙතත්, භාණ්ඩාගාරය විසින් කාලීනව මුදල්

නිදහස්කිරීමේ ප්‍රමාදයන් සහ ඉඩම් අත්පත්කරගැනීමේ අරමුණ සඳහා අයදුම්පත් ඉදිරිපත්කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා වෙන්කිරීමෙන් සියයට 12 ක ප්‍රතිශතයක් නියෝජනය කරන රු.මිලියන 130.5 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**----------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** අමාත්‍ය මණ්ඩලයේ 2015 ජූලි 06 දින පැවති එහි රැස්වීමේදී කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ රු.මිලියන 158,385.78 ක පිරිවැයකට චීන කොන්ත්‍රාත් සමාගමකට මීරිගම සිට කඩවත දක්වා මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. තවද, සැලසුම් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහාවූ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව ලංකා බැංකුව සමඟ සිදුකරන ලද මූල්‍ය වැඩපිළිවෙල යටතේ රු.මිලියන 2,548.92 ක පිරිවැයකට බද්ධ ව්‍යාපාර සමාගමකට පිරිනමා තිබුණි. 2016 දෙසැම්බර් 29 දින, කොන්ත්‍රාත්කරු භූතාක්ෂණික විමර්ශන කටයුතු, සවිස්තරාත්මක ව්‍යුහ සැලසුම් නිර්මාණය කිරීම සහ කුළුණ ගැසීම් පරීක්ෂා යනාදිය ආරම්භ කර තිබුණි.

**(ආ)** සති 26 ක් ඇතුළත ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනම් කිරීමට සහ නිමකිරීමට නිළධාරීන්ට රු.මිලියන 18.05 එකතුවූ මුදලක් දිරිදීමනා ගෙවා තිබුණද, 2016 දෙසැම්බර් 31 දිනට එවැනි කටයුතුවලින් සියයට 62 ක් පමණක් නිම කර තිබුණි.

**3.3 මූල්‍ය පාලන ගැටළු**

**--------------------**

සමාලෝචිත වර්ෂය තුල ඉඩම් අත්පත් කරගැනීමේ පිරිවැය හැර ව්‍යාපෘතියේ මුළු පිරිවැය වන රු.මිලියන 83.91 න් සියයට 15.5 ක් නියෝජනය කරන රු.මිලියන 13.04 ක මුදලක් මෝටර් වාහන කුලියට ගැනීම සහ නඩත්තු කිරීම සඳහා වැයකර තිබුණු බව නිරීක්ෂණය විය. විගණනයේදී නිරීක්ෂණයවූ ඒ සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයන් පහත විස්තර කෙරේ.

**(අ)** ව්‍යාපෘතිය විසින් කුලියට ගන්නා ලද මෝටර් වාහනයක් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශයේ සේවයේ නිරතවී සිටි උපදේශකවරයකුට වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා ඉඩදෙන ලද සීමාවන් ඉක්මවා කිලෝමීටර් 7,207 ක් ධාවනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ)** සමාලෝචිත වර්ෂය තුල මෝටර් වැන් රථයක් කුලියට ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් තරඟකාරීත්වය වැඩිකිරීමට ඇති අවස්ථා මඟහරිමින්, ලියාපදිංචි සැපයුම්කරුවන් 13 දෙනෙකුගෙන් 07 දෙනෙකුගෙන් මිළ ගණන් කැඳවා තිබුණි. තවද, තෝරාගත් ලංසුකරුට තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව අදාල මෝටර් වැන් රථය වෙනස් කිරීමට ඉඩ සලසා තිබුණි.

**(ඇ)** ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද මෝටර් වාහන 02 කට අදාල ලියකියවිලි සහ ධාවන සටහන් අවභාවිතා කිරීමට ඉඩ සලසමින් ව්‍යාපෘතිය විසින් නඩත්තු කර නොතිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------**

2016 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුවරයා, නැවත පදිංචිකිරීමේ සහයකයා, ප්‍රසම්පාදන විශේෂඥවරයා, ඉඩම් මිනින්දෝරුවරයා, තාක්ෂණික නිළධාරියා සහ ව්‍යාපෘති ප්‍රමාණ මිනුම්කරු ඇතුළත් ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුරු හිස්ව පැවතුණි.එය ව්‍යාපෘතියේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරීත්වය සඳහා අහිතකර ලෙස බලපා තිබුණි.